# ග්‍රාමීය සංවර්ධනය සඳහා කුඩා පරිමාණ ව්‍යවසාය සංවර්ධනයේ ඇති වැදගත්කම (යටියන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන්)

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

**යූ එම් විජේසිංහ**[1]

**යූ ඒ චන්ද්‍රසේන**[2]

**සංක්ෂේපය**

සංවර්ධනය වන රටවල ග්‍රාමීය සංවර්ධනය යනු එකී රටවල ජාතික සංවර්ධනයයි. ග්‍රාමීය ප්‍රදේශවල සංවර්ධනයේදී මතුවන දරිද්‍රතාව, සේවා වියුක්තිය හා ආදායම් බෙදීයාමේ විෂමතා යන ගැටලු විසඳාලීමේ යාන්ත්‍රණය ලෙස හඳුනාගෙන ඇත්තේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ය. ව්‍යවසාය සංවර්ධනයේදී දිරිමත් කිරීම්, මූල්‍ය පහසුකම්, තාක්‍ෂණය, දැනුම හා වෙළඳපොළ සම්පාදනය වැනි ක්‍රමෝපායන් ග්‍රාම සංවර්ධනය සඳහා කෙතරම් වැදගත්ද යන්න අධ්‍යනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණයි. ඒ තුළින් ග්‍රාමීය ප්‍රදේශවල ව්‍යවසාය සංවර්ධනය ආශ්‍රිතව සිදුකළ යුතු වෙනස්කම් හෝ වර්ධනය කළ යුතු අංශයන් පිළිබඳව ප්‍රතිපත්ති සම්පාදකයන් හා අනෙක් පාර්ශවයන් දැනුවත් කිරීමට හැකිය.

මෙම අධ්‍යයනය කෑගල්ල දිස්ත්‍රික්කයේ, යටියන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පහළ ගරාගොඩ ග්‍රාමයේ කරන ලද ක්‍ෂේත්‍ර අධ්‍යයනයකින් සමන්විතය. විචල්‍යයන් කිහිපයකට අනුව සසම්භාවී ලෙස කුඩා පරිමාණ ව්‍යවසායන් 25 ක් නියැදිය ලෙස තෝරාගෙන ඇත. විවිධ මූලාශ්‍රය මඟින් ද්විතීක දත්ත රැස් කළ අතර, ප්‍රාථමික දත්ත ඒකරාශී කිරීමේදී ප්‍රශ්නාවලි හා අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා ක්‍රමය භාවිතා කරන ලදි. දත්ත විශ්ලේෂණය කිරීමේදී භූගෝලීය තොරතුරු පද්ධති හා පැතිරුම් පත් (excel) යන පරිගණක මෘදුකාංග ක්‍රමයන් භාවිතා කරන ලදි.

ඒ අනුව මෙම පර්යේෂණයේ ප්‍රතිඵල වන්නේ රාජ්‍ය හෝ රාජ්‍ය නොවන විවිධ ආයතනයන් මඟින් ප්‍රදේශයේ ව්‍යවසාය සංවර්ධනය සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇතත්, දැනට ව්‍යවසායන් පවත්වාගෙන යන්නන් 72% ක් ප්‍රදේශය තුළ පවතින කිසිදු ව්‍යවසාය සංවර්ධන ක්‍රමෝපායක් සඳහා ප්‍රවේශ වී නොමැති බවය. නියැදියෙන් 52% ක පිරිසක් කිසිදු ආයතනික සහායක් නොමැතිව තම ව්‍යවසායන් සාර්ථක කර ගත හැකි බව විශ්වාස කරයි. ඊට අමතරව ව්‍යවසායකයින්ගේ ස්ත්‍රී පුරුෂ භාවය, වාර්ගිකත්වය අනුව ව්‍යවසායන් පවත්වාගෙන යාමේ වෙනස්කම් හඳුනාගන්නා ලදි. ව්‍යවසායන් බහුතරයක ප්‍රගතිය සතුටුදායක වන අතර, ප්‍රදේශීය සංවර්ධනයේ හා ඔවුන්ගේ ජීවන තත්ත්වයේ වර්ධනයක් පෙන්නුම් කරයි. ව්‍යවසායන් සඳහා පෙළඹීමේ ප්‍රධාන සාධකය වී ඇත්තේ ආදායම් උත්පාදනය සඳහා වෙනත් මාර්ගයක් නොවීම යන්නයි.

මේ නිසා ප්‍රදේශය තුළ පවත්වන ලද ව්‍යවසාය සංවර්ධන ක්‍රමෝපායන් මඟින් ග්‍රාම සංවර්ධනය සඳහා සැලකිය යුතු අනුග්‍රහයක් ලැබී නොමැත. ඊට බලපෑ සාධක 'ව්‍යවසායක චින්තනයන්' හා 'ආයතනික ව්‍යුහයේ තිබෙන ගැටලු' ලෙස වර්ගීකරණය කළ හැක. කුඩා පරිමාණ ව්‍යවසායන් මඟින් පුද්ගල ආදායම් වර්ධනය කරන අතර ඉන් ග්‍රාමයේ ආර්ථික සංවර්ධනය සාධනය කරගැනීමට මහඟු දායකත්වයක් සපයා ඇත. මෙම ගැටලු ද්විත්වයම ආමන්ත්‍රණය කළ හැකි එකම ආකාරය ප්‍රදේශයේ ආයතනික ව්‍යුහයේ හඳුනාගත් ගැටලු සඳහා විසඳුම් ඉදිරිපත් කිරීම සහ ව්‍යවසායකයින් ඊට අභිප්‍රේරණය කිරීමයි. එය ඵලදායි ග්‍රාම සංවර්ධනයක් සඳහා ඉවහල් වේ.

*1. භූගෝල විද්‍යාව, භූගෝලවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*

*2. මහාචාර්ය, භූගෝලවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*